| ....................................... විද්‍යාලය | |
|---|---|
| **අවසාන වාර තක්සේරුව - 20....** | |
| **මව්බස** | **3 ශ්‍රේණිය** |

නම :.................................................................................................................................................

(01) **ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය ලෙස සැලකෙන්නේ නා ගසයි. හිරු එළිය ප්‍රිය කරන ශාකයක් වන මෙය උසට වැඩෙයි. නා ගසේ පත්‍ර දිගටි හැඩයක් ගනියි. සුදු පැහැති මල් පෙතිවලට වට වූ නා මලේ මැද කොටස කහ පැහැයකින් යුක්තය. ඈතට සුවඳ විහිදුවන කුසුමක් ලෙස ප්‍රසිද්ධ නා මල බුදු පුදට ද යොදා ගනී.

1. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය කුමක්ද? ............................................................
2. නා ගසේ පත්‍රවල හැඩය කෙසේද? ............................................................
3. නා මලේ ඇති පාට වර්ග මොනවාද? ............................................................
4. නා මල ප්‍රසිද්ධ කුමක් සඳහා ද? ............................................................
5. මෙහි ඇති ගසට සමාන වචන දෙකක් ලියන්න. ............................................................

   ............................................................
6. ප්‍රසිද්ධ යන්නෙ හි විරුද්ධ පදය කුමක් ද? ............................................................
7. නා ශාකය ප්‍රිය කරන්නේ කුමක්ද? ............................................................
8. නා මලින් ඇති ප්‍රයෝජනයක් ලියන්න. ............................................................

(ලකුණු 2 ×8 = 16)

02) **නිවැරදිව ලියා ඇති වචනය යටින් ඉරක් අඳින්න.**

1. ෂක්තිය, ශක්තිය, සක්තිය, ශක්ථිය
2. විද්‍යාලය, විද්ද්‍යාලය, විද්‍යාළය, විධ්‍යාලය
3. ශිෂ්ෂ්‍යයා, ශිශ්ෂ්‍යයා, ශිෂ්‍යයා, ෂිශ්‍යයා
4. ගවුරවය, ගඋරවය, ගව්රවය, ගෞරවය
5. පරීක්ෂණය, පරීක්ශනය, පරීක්සණය, පරීක්ශණය (ලකුණු 2 ×5 = 10)

(03) **වචන නිවැරදි ලෙස ගළපා වාක්‍ය සාදන්න.**

1. පක්ෂියා යි. / වළි කුකුළා / ජාතික /අපේ

.......................................................................................................................................

2. කියවීම / කරයි / මිනිසා / සම්පූර්ණ

.......................................................................................................................................

3. අපේ / පරිසරය / සුරැකීම / යුතුකමකි.

.......................................................................................................................................

4. සතෙකි / ගවයා / අපට / ප්‍රයෝජනවත්

.......................................................................................................................................

5. දරුවෝ / හොඳ / වෙමු / අපි

.......................................................................................................................................

(ලකුණු 2 ×5 = 10)

(04) **තනි වචන ලියන්න.**

1. රාත්‍රියේ හැසිරෙන ......................................................................

2. පාද හතරක් ඇති ......................................................................

(ලකුණු 2 1/2 ×2 = 5)

(05) **ගැළපෙන සේ යා කරන්න.**

| | | |
|---|---|---|
| 1. | පුරුෂ ලිංග ඒක වචන නාම පදයකි. | මිනිසා |
| 2. | අප්‍රාණවාචී බහුවචන නාම පදයකි. | අක්කලා |
| 3. | බහුවචන ක්‍රියා පදයකි. | ගොවියා |
| 4. | ප්‍රාණවාචී ඒකවචන නාම පදයකි. | දුවති |
| 5. | ස්ත්‍රී ලිංග බහු වචන නාම පදයකි. | ගස් |

(ලකුණු 2 ×5 = 10)

**(06) නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(ශක්තිය , නුවණ , දකුණ , සෝදිසියෙන් , විශේෂ)

1. අරුණි ............................................. ඒ දෙස බැලුවා.
2. අපට සෙල්ලම් කරන්න ............................................. ඕනෑ.
3. ............................................. බලා වම බලන්න.
4. හඳට යන්නේ ............................................. යානා වලින් ය.
5. ඔබ අපට ............................................. පාදා දුන්නා.

(ලකුණු 2 ×5 = 10)

**(07) ලියන බසින් ලියන්න.**

1. කුරුල්ලා ගස උඩ කූඩුවක් සාදනවා.

.............................................................................................................................

2. ගොවියෝ උදැසන කුඹුරු කොටනවා.

.............................................................................................................................

3. මම පොත පාඩම් කරනවා.

.............................................................................................................................

4. කිරි අම්මා වට්ටියට මල් නෙළනවා.

.............................................................................................................................

5. අපි පන්තිය පිරිසිදු කරනවා.

.............................................................................................................................

(ලකුණු 3 ×5 = 15)

**(08) පහත වාක්‍ය දී ඇති රූල තුළ නිවැරදි ලෙස ලියන්න.**

වඩුවා අලංකාර ලී බඩු සාදයි.

.............................................................................................................................

.............................................................................................................................(ලකුණු 5)

(09) **පහත දෙබස කියවා ගැළපෙන පිළිතුරු තෝරා ලියන්න.**

(රුපියල් හතළිහක් දෙන්න, මේ ඇපල් ගෙඩියක් කීයද? , මිදි ගන්නේ නැද්ද,)

වෙළෙන්දා : පලතුරු ලාබයි , එන්න ගන්න

පියුමි : ..............................................................................................................

වෙළෙන්දා : ඇපල් ගෙඩියක් රුපියල් විස්සයි.

පියුමි : මට ඇපල් ගෙඩි දෙකක් දෙන්න.

වෙළෙන්දා : ..............................................................................................................

පියුමි : ආ, මෙන්න රුපියල් හතළිහ

වෙළෙන්දා : ..............................................................................................................

පියුමි : එපා, මට මිදි ඕනෙ නෑ

(ලකුණු 2 ×3 = 6)

(10) **පහත රූප බලා වචන හතරක වගන්ති 06 ලියන්න.**

(ලකුණු 12)



1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................
5. ..............................................................................................................
6. ..............................................................................................................